# අධිකරණ සේවා කොමිෂන් සභාව

## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ සභාපති හා සාමාජික තනතුරු

01. 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනත මගින් සංස්ථාපිත පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ සභාපති තනතුර (01) හා සාමාජික තනතුර (01) සඳහා අයදුම්පත් කැඳවීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත. සියලුම අයදුම්පත් එම අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන 2024.07.25 දින හෝ ඊට පෙර අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත එවිය යුතුය.

02. සුදුසුකම් :

අ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට රාජ්‍ය නිලධරයෙකු වශයෙන් අවුරුදු 20කට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන්

හෝ,

ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට නීතිඥ වෘත්තියේ අවුරුදු 10 කට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන්,

03. සභාපති තනතුර සඳහා ගෙවනු ලබන දීමනා පහත පරිදි වේ.

- මාසික පාරිශ්‍රමිකය - රු. 135,000
- මාසික ප්‍රවාහන දීමනාව - නිල වාහනයක් හෝ නිල රථ දීමනාවක් (කොන්දේසි අදාළයි)
- ඉන්ධන දීමනාව - (මාසික) වෙළඳපොලෙහි පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව ඉන්ධන ලීටර 220 ක දීමනාවක්
- දුරකථන දීමනාව - රු. 10,000 (මාසිකව)

04. සාමාජිකයෙකුට ගෙවනු ලබන දීමනා පහත පරිදි වේ.

- මාසික පාරිශ්‍රමිකය - රු. 90,000
- මාසික ප්‍රවාහන දීමනාව - පදිංචි ස්ථානයේ සිට කි.මී.350 දක්වා රු.25,000, කි.මී.350 ඉක්මවන විට රු.50,000ක මාසික දීමනාව
- දුරකථන දීමනාව - රු. 8,000 (මාසිකව)

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

**එච්.එස්. සෝමරත්න**
**ලේකම්**
**අධිකරණ සේවා කොමිෂන් සභාව**

2024 ජුලි මස 05 වන දින
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.